# ඔබ අසිරිමත්ය.....

**අ.පො.ස සාමාන්‍යපෙළ සිසුන් සඳහා**

**වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව**



අනුෂා ගෝකුල ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්,
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**
සිතාරා ජයසේන
අධ්‍යක්ෂ ( වෘත්තීය මාර්ගෝපදේශ )

එච්.ජී.කේ.දීපශිකා
සහකාර අධ්‍යක්ෂ ( වෘත්තීය මාර්ගෝපදේශ )

සංස්කරණය
තුෂාරි අනුරුද්ධිකා ( වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරී)

**අත්පොත් සැකසුම් කණ්ඩායම :-**

| | |
|---|---|
| නිලන්ති පෙරේරා | ( වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරී ) |
| ඒරන්දති රන්දෙනිය | ( වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරී ) |
| ප්‍රියන්ත විජේගුණසේකර | ( වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරී ) |
| ඒල්.ජී ප්‍රේමසිරි | (මානව සම්පත් සංවර්ධන නිළධාරී) |
| ඒම්. ප්‍රේමරත්න | (මානව සම්පත් සංවර්ධන නිළධාරී) |
| සී. ඒන්.සී සමරසිංහ | (මානව සම්පත් සංවර්ධන නිළධාරී) |
| අජිත් වික්‍රමසිංහ | (මානව සම්පත් සංවර්ධන නිළධාරී) |
| චන්ද්‍රකා වීරරත්න | (මානව සම්පත් සංවර්ධන නිළධාරී) |

සම්බන්ධීකරණය
රෝහිත ගල්හේන (මානව සම්පත් සංවර්ධන නිළධාරී)

## ආයුබෝවන් !

## සුභ දවසක්

ඔබ ඔබේ ජීවිතයේ වගකීම ගන්නේ නම් සිහින සැබෑ කර ගැනීමේ මාවත ඒයයි.

ඔබ දැන් අවුරුදු 16 පමණ මෙලොව ජීවත් වී ඇති ඔබට ඔබ ගැන තීරණ ගන්නට , අනාගතය සැලසුම් කර ගැනීමට අවශ්‍ය ශක්තිය දැන් ඔබට හිමිව තිබේ.

ඔබගේ අනාගතය සාර්ථක කර ගැනීමේ වගකීම පැවරී ඇත්තේ ඔබටයි. ඔබ අයිති ඔබටයි. ජීවත් විය යුත්තේ ඔබයි. ඒහෙයින් අනාගත දිවිපැවැත්ම කවරක්ද යන්න තීරණය කළ යුත්තේ ඔබ විසින්ම ය.

අනාගතය දෙස බලන්න.... ඔබ යා යුත්තේ කවර ඉසව්වකටදැයි සිතන්න .....

ඒ සඳහා අදම සැළසුම් කරන්න.

අද ඔබ කවර තත්ත්වයක සිටියද ඉදිරි ජීවිතය පිළිබඳ දැක්මකින් යුතුව ඔබ වගකීම් සහගතව ක්‍රියා කරන්නනේ නම් පවතින දුෂ්කරතා, බාධාක, අභියෝග ජය ගැනිම දුෂ්කර නොවනු ඇත.

සිතන්න ඔබව ශක්තිමත් කරන්නේ ඔබ අභියස ඇති අභියෝගයි.

වෙනස්වන ලෝකය තුළ මතුවන අභියෝගකාරී තත්ත්වයන් හමුවේ ඉදිරි ජීවිතයට මඟපෙන්වීම සඳහා දෙමාපියන්, ගුරුවරුන් සේම වෘත්තීමය උපදේශකවරයෙකුගේ සහාය අවශ්‍ය වේ. මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශය අංශය යනු ඒලෙස වෘත්තීමය සේවාවන් ලබාදෙන රාජ්‍ය ආයතනයකි.

ඒබැවින් ඔබටම සුවිශේෂී වූ ඔබගේ අනන්‍යතාවය හඳුනා ගනිමින්, අනාගත වෘත්තීය, අධ්‍යාපනික තීරණ ගැනිමට, ජයග්‍රාහී ඉලක්ක කරා නිසැකව ගමන් කිරීමට, ජීවිත සිහින සාර්ථක ලෙස සැබෑ කරගැනිමට අවශ්‍ය අත්වැල සැපයිමට, අතරමං නොවී ජයග්‍රාහිව ඉලක්කය කරා යාමට , ජීවිතය සාර්ථක කර ගැනිමට මඟපෙන්වන්නට අප සූදානම්.

එන්න අප හා ඒක්වන්න...

**වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන සේවාවන්**
**සපයන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය සමඟ .....**



# පටුන


1 අනාගත ජීවිතය හා සාමාන්‍ය පෙළ විභාගය.

2 ඔබව හඳුනා ගන්න

3 උසස්පෙළ විෂය ධාරාව තෝරා ගැනිම

3.1 කලා විෂය ධාරාව

3.2 වානිජ්‍යය විෂය ධාරාව

3.3 ජීව විද්‍යා විෂය ධාරාව

3.4 භෞතික විද්‍යා විෂය ධාරාව

3.5 තාක්ෂණික විෂය ධාරාව

3.6 පොදු විෂය ධාරාව

3.7 13 වසරක සහතික ලත් අධ්‍යාපනය

4 සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානම් විම -පාඩම් කිරීමේ හා මතක තබා ගැනීමේ ක්‍රමවේද

5 අ.පො.ස. සාමාන්‍ය පෙළින් පසු ඇති විකල්ප අවස්ථා

5.1 විශ්ව විද්‍යාල බාහිර පාඨමාලා

5.2 විදේශීය විශ්ව විද්‍යාල

5.3 වෘත්තීමය විභාග


5.4 වෘත්තීය හා තාක්ෂනික පුහුණු ආයතන

5.6 ව්‍යවසායකත්වය

5.7 රැකියාවක් සමඟ ඉගෙන ගැනිම

1






## 1. අ.පො.ස(සාමාන්‍ය පෙළ ) විභාගය සහ ඔබ

පියවර දහස් ගණනක බොහෝ දුර ගමනක් වුව ඇරඹෙන්නේ ඒක් පියවරකිනි. ඒ පියවර අතිශයින්ම වැදගත්ය. ඔබ වර්තමානයේ කරනු ලබන කටයුතු අනාගත ජීවිතය තීරණය වීමට පදනමක් සපයනු ලබයි. (Future depends on what you do today)

ඒ අනුව සලකා බලන විට අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය යනු ඔබගේ ජීවිතයේ පළමු තීරණාත්මක කඩඉමකි. ඔබේ ජීවිතය පුරෝකතනය කළ හැකි හැරවුම් ලක්ෂයකි. එසේ නම් ජීවිතයේ තීරණාත්මක මංසන්ධියේ දී සාර්ථක පුද්ගලයෙකු, සාර්ථක වෘත්තිකයෙකු විමට සේම ඒමගින් ලෝකයට මෙහෙවරක් කිරීමට ඔබ අදිටන් කරගත යුතු වේ.

ඒනිසා අද සාමාන්‍ය පෙළ පංතියේ සිටින ඔබ ඔබේ සිහින සැබෑ කරගනිමින් අනාගතයේ සාර්ථක වෘත්තිකයෙකු විමටත්, රටට දැයට සේම ලෝකයට උතුම් මෙහෙවරක් කල හැකි පුද්ගලයෙක් බවට පත්විමටත් අදිටන් කරගත යුතු අතර ඒ අනුව ක්‍රියා කළ යුතු වේ.

<u>අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය මෙතරම් වැදගත් වන්නේ ඇයි?</u>

- ජීවිතයේ පළමු තීරණාත්මක මංසන්ධියක් වීම.
- තම හැකියාව හා ලැදියාව අනුව අධ්‍යාපන හා වෘත්තීය අරමුණු අධ්‍යපන හා වෘත්තීය අරමුණු ගොඩනගා ගැනිමට පදනම සැකසීම.
- විකල්ප මාර්ග ඔස්සේ ජීවිතය සැලසුම් කර ගැනීමට ඇති හැකියාව.
- රැකියාවකට ප්‍රවේශ වීමේ අවම සුදුසුකම වීම
- ජීවිත දැක්මේ වෙනසක් ඇතිවිම

අ.පො.ස.(සා.පෙ.)විභාගය සමත්කම් සනාථ කරන පරීක්ෂණයක් මිස තරඟකාරී විභාගයක් නොවේ ඒනිසා සමත් විම අසීරු නොවේ. ඒනිසා මෙම විභාගය සමත් වී අනාගතයේ දොර කවුළු විවර කරගැනිමට ඔබ අදිටන් කර ගත යුතු වේ.

.




# 2
# ඔබව හඳුනාගන්න

**වෘත්තීය යතුර (Career Key) පරීක්ෂණය ඇසුරෙන් ඔබගේ ලැදියා,හැකියා, අගය කිරීම් පද්ධතිය ඇතුලත් පෞරුෂ ස්වභාවය හඳුනා ගෙන ඊට අදාලව අධ්‍යාපන, වෘත්තීය තේරීම් පිළිබඳ තීරණ ගන්න.**






## 2 සැබවින්ම ඔබ ඔබව හඳුනා ගන්නේ ඔබව අර්ථකථනය කරන්නේ කෙසේද?

ආරය හා පරිසරය -

සෑම පුද්ගලයෙකුම සුවිශේෂී වේ. අනන්‍ය වේ . උපතින්ම පුද්ගලයා ශක්ති සම්භාරයක් මෙලොවට රැගෙන ඒන අතර පරිසරය තුළින් ඒම හැකියාවන් වර්ධනය කරගනී.

- අනාගත වෘත්තිය තීරණ ගැනිම සඳහා ආරයෙන් ගෙන ආ හා පරිසරයෙන් දියුණු කරගත් ඔබගේ ලැදියාවන්,හැකියාවන්, අගය කිරීම් පද්ධතිය පිළිබඳ ස්වයං තක්සේරුවක් මඟින් හඳුනා ගත යුතුවේ. ඒය වෘත්තිය සංවර්ධනයේ පළමු පියවරයි.
- ස්වයං තක්සේරුවක් මඟින් ඔබ හඳුනාගැනිම සඳහා විවිධ පරීක්ෂණ, ක්‍රමශිල්ප භාවිතා කළ හැකිය. මෙහි සඳහන් වෘත්තීය යතුර පරීක්ෂණයද පුද්ගලයා හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන මනෝ විද්‍යාත්මක පරීක්ෂණයකි.


වෘත්තීය යතුර පරීක්ෂණය (Career Key Test ) ඇසුරෙන් ස්වයං තක්සේරු පරීක්ෂණය

- මෙහි ඇති ස්වයං තක්සේරු පරීක්ෂණය කිරීමෙන් ඔබට ඔබ සතු හැකියාවන්, දක්ෂතාවයන් ඔබගේ අගය කිරීම් පද්ධතිය ආදියෙන් සමන්විත ඔබගේ පෞරුෂ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.




- මෙම පෞරුෂ පරීක්ෂණය මඟින් ප්‍රස්ථාරයේ පෙන්වා ඇති පරිදි
  යථාර්ත නිරූපිත(R),
  පරික්ෂාකාරි/ සෝදිසිකාරි(I),
  කලාත්මක(A)
  සමාජීය(S)
  ධෛර්ය සම්පන්න(E)
  චාරිත්‍රානුකූල (C)ආදි ලෙස හය වර්ගයකට අයත් පෞරුෂ ස්වභාවයන් මනිනු ලැබේ.

- ඒ අනුව ඔබට වඩාත් ගැලපෙන අධ්‍යාපන මාවත් ඒ හා සබැඳි වෘත්තීය අවස්ථා පිළිබඳ තීරණයක් ගත හැකි වනු ඇත. ඒහිදී
  - ඔබගේ පෞරුෂ ස්වභාවය
  - ඒ අනුව වඩාත් ගැලපෙන විෂයයන්,විෂය ධාරාවන්
  - විෂය ධාරාවන්ට අදාලව විවෘත වන අධ්‍යාපන, වෘත්තීය මාවත්,
  - ඒ සඳහා අද සපුරාගත යුතු සුදුසුකම්
  - ඒ අනුව සැකසූ වෘත්තීය සැලැසුම



ඔබ, බව දකින්නේ කෙසේ ද?

පහත එක් එක් ප්‍රකාශ කියවා එය කොතෙක් දුරට ඔබවිස්තර කරන්නේදැයි තීරණය කරන්න.ප්‍රකාශය ඔබ සම්බන්ධයෙන් ඉතා නිවැරදි නම් ඊට ඉදිරියෙන් 2ලියන්න.
ප්‍රකාශය ඔබ සම්බන්ධයෙන්ය බොහෝ දුරට නිවැරදි නම් ඊට ඉදිරියෙන් 1ලියන්න.
ප්‍රකාශය මගින් ඔබ විස්තරනොකරන්නේ නම් ඊට ඉදිරියෙන් 0ලියන්න.

## R

_______සතුන් උපකරණ හෝ යන්ත්‍ර සූත්‍ර සමග වැඩ කිරීමට මා කැමතිය.

_______මගේ වයසේ අනික් අය සමග සසඳන විට මට උපකරණ, යන්ත්‍ර සූත්‍ර හෝ සතුන් සමග වැඩකිරීමේ හා යාන්ත්‍රික ඇඳීම් ආදියේ ඉහල හැකියාවක් ඇත.

_______මම ප්‍රායෝගික දේ අගය කරමි. දැකිය හැකි ස්පර්ෂ කල හැකි ගස්වැල් හා සතුන් හදා වඩා ගන්නටත් වඩා

## I

_______මා ගණිතය හෝ විද්‍යා ගැටළු ඉගෙන ගැනීමට හා විසඳීමට කැමතිය.

_______මගේ වයසේ අනික් අය සමග සාපේක්ෂව මට ගණිත හා විද්‍යා ගැටළු අවබෝධකර ගැනීමේ හා ඒවා විසඳී මේ ඉහල හැකියාවක් ඇත.

_______මා විද්‍යාව අගය කරනවා

_______මා සූක්ෂම, විද්‍යාත්මත බුද්ධිමත් අයෙක්.

## A

_______මා චිත්‍ර, නාට්‍ය, කලා ශිල්ප, නැටුම්, සංගීතය හෝ නිර්මාණාත්මක ලේඛණය වැනි නිර්මාණශීලී දේ වලට කැමතිය

_______මගේ වයසේ අනික් අය සමග සාපේක්ෂව නිර්මාණාත්මක ලේඛණය, නාට්‍ය, කලා ශිල්ප, සංගීතය,චිත්‍ර වැනි ක්ෂේත්‍රයන්හි ඉහල කුසලතාවයක් මට ඇත.

_______නිර්මාණශීලී ලේඛකයන් අතින් බිහිවූ නාට්‍ය, සංගීතය, චිත්‍ර වැනි නිර්මාණාත්මක කලා කටයුතු මම අගය කරමි.

_______මා ඉතා ප්‍රතිභා සම්පන්න කලාත්මක, පරිකල්පනාත්මක හැකියාවන් ඇති ස්වාධීන අයෙකි

## S

_______ඉගැන්වීම, ප්‍රථමාධාර දීම, තොරතුරු සපයා දීම වැනි මිනිසුන්ට උදවු කළ හැකි දේ කිරීමට මා ඉතා තැමතිය.

_______මගේ වයසේ අනික් අය සමග සාපේක්ෂව මා ඉගැන්වීම, උපදේශණය, උපස්ථායන හෝ තොරතුරු සැපයීම වැනි ක්ෂේත්‍රයන්හි විශේෂ දක්ෂතාවයක් දක්වයි.

_______මම මිනිසුන්ට උදව්කිරීම හා සමාජ ප්‍රශ්ණ විසඳීම අගය කොට සලකමි.

_______මා අන්අයට උපකාර වන මිත්‍රශීලී හා විශ්වාසවන්ත අයෙකි

## E

_______මා මිනිසුන්ට නායකත්වය දීමට හා ඔවුන්ව මෙහෙයවීමටත් අදහස් හා දේවල් විකිණීමටත් ඉහල හැකියාවන් ඇති අයෙකි.

_______මගේ වයසේ අනික් අය සමග සසඳන විට මා මිනිසුන් පාලනය කිරීමේ හා දේවල් විකිණීමේ හැකියාවන්ගෙන් ඉහල තත්ත්වයක සිටී.

_______මම දේශපාලනය, නායකත්වය හා ව්‍යාපාර අගය කරමි.

_______මා උද්‍යෝගීමත් අධිෂ්ඨානශීලී හා සමාජශීලී අයෙකි.

## C

_______මම ක්‍රමාණුකූලව සංඛ්‍යා, වාර්ථා හෝ යන්ත්‍ර සූත්‍ර සමග වැඩ කිරීමට කැමැත්තෙමි.

_______මගේ වයසේ අනික් අය සමග සසඳන විට මා පිළිවෙළකට හා ක්‍රමාණුකූලව, සංඛ්‍යා, ලිඛිත වාර්තා සමග වැඩ කිරීමේ සුදුසු තත්ත්වයන්ගෙන් ඉහලයි.

_______ව්‍යාපාර මගින් සාර්ථකවීම මම අගය කරමි.

_______මා ක්‍රමාණුකූල මෙන්ම සැළසුම් කළ දෙය හොඳින් අනුගමනය කිරීමේ හැකියාවෙන් යුක්තය.

පහත ලැයිස්තුගත රැකියා සම්බන්දයෙන්ඔබ නියත වශයෙන් කැමැත්තක් දක්වන හෝ කිසියම් ආකාරයකින් ඔබ ප්‍රිය කරන රැකියාවලට 2ලියන්න. ඔබ තුල යම් කැමැත්තක් ඇතිකල හැකි රැකියාවලට1ලියන්න.ඔබ මෙතෙක් තීරණය කර නැති හෝ ඔබට ප්‍රමාණවත් ප්‍රියතාවයක් නොමැති හෝ ඔබ අකමැති  රැකියාවක් නම් 0ලියන්න.

R____ බස් රථ රියදුරු
(Bus Driver)

S____ භෞත
චිකිත්සත(Physical
Therapist)

R____ මත්ස්‍යා/ගොවිපල පාලක
(Fish and Farm Warden)

S____ පුස්තකාලයාධිපති
(Librarian)

R____ ගොවි මහතා (Farmer)

S____ සාත්තු හෙද
(Nurse)

C____ රක්ෂණ ලිපිකරු
(Insurance Clerk)

A____ රෙදි නිර්මාණකරු
(Clothes Designer)

C____ උසාවි ලඝුලේඛිකා
(Court Stenographer)

A____ නැටුම් ශිල්පී (Dancer)

C____ බැංකුවේ මුදල් ගණන්
කරන්නා (Bank Teller)

A____ සංගීතඥයා (Musician)

I____ ජීව විද්‍යාඥයා
(Biologist)

E____ නීතීඥයා
(Lawyer)

R____ ට්‍රක් රථ මෙහෙයවන්නා
(Truck Mechanic)

S____ අනුශාසක
(Counselor)

R____ අහස්යානා පදවන්නා
(Air Plane Pilot)

S____ භාෂා චිකිත්සක
(Speech Therapist)

C____ බැංකු පරීක්ෂක (Bank
Examiner)

A____ නළු/ නිළි
(Actor/Actress)

C____ පොත් තබන්නා
(Bookkeeper)

A____ චිත්‍ර ශිල්පී (Artist)

E____ වෙළඳ කළමණාකරු
(Sales Manager)

I____ රසායනඥ (
Chemist)

E____ නවාතැන් කළමනාකරු
(Apartment Manager)

I____ තාරකා සාස්ත්‍රඥයා
(Astronomer)

E____ ගුවන් විදුලි/ රූපවාහිනී
නිවේදක (Radio/TV Announcer)

I____ විද්‍යාගාර තාක්ෂණ ශිල්පී
(Laboratory Technician)

R____ වඩු
(Carpenter)

S____ සමාජ සේවා
(Social Worker)

R____ යාන්ත්‍රික ඉංජිනේරු
(Mechanical Engineer)

S____ ගුරුවරයා (Teacher)

C____ බදු විශේෂඥ
(Tax Expert)

A____ නවකතා රචකයා
(Novelist)

C____ ව්‍යාපාර ගුරු
(Business Teacher

A____ ගායක (Singer)

E____ වෙළඳ නියෝජිත
(Salesperson)

I____ විදුලි ඉංජිනේරු
(Electrical Engineer)

E____ නිවාඩු නිකේතන
කළමණාකරු (Restaurant
Manager)

I____ රසායන තාක්ෂණ ශිල්පී
(Chemical Technician))

E____ රක්ෂණ වෙළඳ
නියෝජිත (Insurance Seles
Agent)


I____ පර්යේෂණාත්මක විද්‍යාඥ
(Research Scientist)

පළමුපරීක්ෂණයේලකුණුපේලි 1 හිද, දෙවනපරීක්ෂණයේලකුණුපේලිඅංක 2 හිද, අක්ෂරවලටඅදාලවයොදන්න. එමපේලිදෙකෙහිඑකතුවපේලිහිදයොදන්න

ඔබේ වෘත්තීය යතුර

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **පේලි 1** + | R ____ | I ____ | A ____ | S ____ | E ____ | C ____ |
| **පේලි 2** = | R ____ | I ____ | A ____ | S ____ | E ____ | C ____ |
| **එකතුව** | R ____ | I ____ | A ____ | S ____ | E ____ | C ____ |

දැන් ඔබ ඔබේ යතුර සෑදීමට සූදානම්. ඉහත එකතුව පේලියෙහි R සඳහා ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය කුඩා කතිරයක ආකාරයට (X) ප්‍රස්තාරයේ “R” අකුරට ඉහලින් සඳහන් කරන්න. ඉතිරි අක්ෂර සඳහා ද එම ආකාරයෙන් සිදු කරන්න. ඉන් පසු කතිර සලකුණු යා කරමින් රේඛාවක් නිර්මාණය කරන්න. මේ ඔබේ වෘත්තීය යතුරයි.




CONFIDENTIAL

ආචාර්ය ජෝන් හෝලන්ඩ්ට අනුව මිනිසුන්ගේ පෞරුෂත්ව වර්ග 6 කි.

R - යථාර්ත නිරූපිත/යථාර්තවාදී

I - පරීක්ෂාකාරී/සෝදිසිකාර

A - කලාත්මක

S - සමාජයීය

E - ධෛර්යය සම්පන්න

C - චාරිත්‍රානුකූල

ඔබේ වෘත්තීය යතුරෙන් ඔබ ලබාගත් වැඩිම ලකුණු පුමාණයන්ගෙන් දැක්වෙන්නේ ඔබ වඩාත්ම කැමති පෞරුෂ ස්වභාවයහෝ පෞරුෂත්ව ස්වභාවයන්ය.

- ඔබගේ පෞරුෂය සකස් වී ඇත්තේ මෙහි සඳහන් පෞරුෂ කිහිපයක සංකලනයක් තුළිනි. ඒනිසා ප්‍රස්ථාරයේ ඉහළින්ම ලකුණු ලබාගත් පෞරුෂ වර්ග 3 සැලකිල්ලට ගන්න.

- ඉහලින්ම ලබාගත් පෞරුෂ වර්ගීකරණයන් තුන සැලකිල්ලට ගෙන ඊට වඩාත් ගැලපෙන ලෙස විෂය ධාරාවන් තෝරාගැනිම කළ හැකි වේ.

- ඔබේ සුවිශේෂීභාවයට ගැලපෙන ඒක් අවස්ථාවක් පමණක් නොව අවස්ථා බොහෝ ප්‍රමාණයක් ඇති නිසා ඒයට ගැලපෙන අවස්ථා පිළිබඳ වෘත්තීය උපදේශකවරයෙකුගේ සහාය ලබා ගැනීමත්, ඔබ තවදුරටත් මේ පිළිබඳව ගවේෂණය කිරීම, විමසා බැලීම අත්‍යාවශ්‍යය වේ.

CONFIDENTIAL

# 3
# උසස්පෙළ විෂය ධාරාවන් තෝරා ගැනීම



කලා විෂය ධාරාව

වානිජ්‍යය විෂය ධාරාව


ජීව විද්‍යා විෂය ධාරාව

භෞතික විද්‍යා විෂය ධාරාව

තාක්ෂණික විෂය ධාරාව

පොදු විෂය ධාරාව

13 වසරක සහතික ලත් අධ්‍යාපනය




CONFIDENTIAL

# 3.1

## කලා විෂය ධාරාව (Arts Stream)

කලා විෂය ධාරාවේ කාණ්ඩ

**සමාජ විද්‍යා විෂයයන්(ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂයයන්)**

ආර්ථික විද්‍යාව, .ව්‍යාපාර සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව ඉතිහාසය(ලංකා ඉතිහාසය සමඟ ඉංදීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ ලෝක ඉතිහාසය) ,තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය,ඉංග්‍රීසි,ජර්මන්,ප්‍රංශ,කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය / උසස් ගණිතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය,භෞතික විද්‍යාව

**ආගම හා ශිෂ්ටාචාර විෂයයන්**

- බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය,
- ක්‍රිස්තියානි ධර්මය හෝ .ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය,
- හින්දුධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය
- ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය,
- ග්‍රීක හෝ රෝම ශිෂ්ටාචාරය

**සෞන්දර්ය අධ්‍යයන විෂයය**

- . චිත්‍ර කලාව,
- නර්තනය(දේශීය හෝ භරත නාට්‍ය),
- සංගීතය(පෙරදිග සංගීතය හෝ කර්ණාටක සංගීතය හෝ බටහිර සංගීතය,
- නාට්‍ය හා රංග කලාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි )

**භාෂා විෂයයන්**

- ජාතික භාෂා
- සිංහල/දෙමළ/ඉංග්‍රීසි
- සම්භාව්‍ය භාෂා
- අරාබි/පාලි/සංස්කෘත
- විදේශීය භාෂා
- චීනප්‍රංශ,ජර්මන්, හින්දි, ජපන්, මැලේ, හින්දි

**ශාස්ත්‍ර පීඨයේ විෂයයන්**

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රිසි
සමාජ විද්‍යාව
ආර්ථික විද්‍යාව
සංඛ්‍යාණනය
භූ ගෝල විද්‍යාව
ඉතිහාසය
පුරා විද්‍යාව
නීතිය
මනෝ විද්‍යාව
ප්‍රජා විද්‍යාව
ජනමාධ්‍ය උපාධිය
අධ්‍යාපනවේදී
භාෂා විෂයයන්

## 3.2

## වාණිජ හා කළමනාකරණ පීඨයේ විෂයයන්

### ප්‍රධාන විෂයයන්(ප්‍රධාන විෂයයන් දෙකක්)

- ගිණුම්කරණය -Accounting
- ව්‍යාපාර අධ්‍යයනය- Business Studies
- ආර්ථික විද්‍යාව - Economics

### තුන්වන විෂය

- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ව්‍යාපාර සංඛ්‍යානය;
- ජර්මන්
- සංයුක්ත ගණිතය හෝ ගණිතය
- ඉතිහාසය
- දේශපාලන විද්‍යාව
- ඉංග්‍රීසි
- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
- ප්‍රංශ
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

### වානිජ අංශයේ උපාධි පාඨමාලා

- ගණකාධිකරණය
- වාණිජ්‍යය
- කළමනාකරණය
- ව්‍යාපාර පරිපාලනය
- රාජ්‍ය පරිපාලනය
- ව්‍යාපාර කළමනාකරණය
- දේපල කළමනාකරණය හා තක්සේරුකරණය
- මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර තොරතුරු පද්ධති
- ගිනුම්කරණ තොරතුරු පද්ධති
- අලෙවි කළමනාකරණය
- පරිගණක පාඨමාලා

3.3

## ජීව විද්‍යා විෂය ධාරාව(Bio-Science )

- ජීව විද්‍යාව-Biology
- රසායන විද්‍යාව-Chemistry
- භෞතික විද්‍යාව-Physics

ප්‍රධාන විෂයයන්(ප්‍රධාන විෂයයන් දෙකක්)

- කෘෂි විද්‍යාව
- සංයුක්ත ගණිතය හෝ ගණිතය
- භෞතික විද්‍යාව

තුන්වන විෂය

- වෛද්‍ය විද්‍යාව/දන්ත වෛද්‍ය විද්‍යාව/පශු වෛද්‍ය විද්‍යාව
- කෘෂි විද්‍යාව
- ආහාර විද්‍යාව හා පෝෂණයතාක්ෂණය
  - ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය
- පෝෂණවේදී
- ඖෂධවේදී
- ආහාර විද්‍යාව
  - ජීව විද්‍යාව
  - භෙද උපාධිය
  - භෞත චිකිත්සක
  - වෛද්‍ය රසායනාගාර

විද්‍යා අංශයේ උපාධි පාඨමාලා

## 3.4

## භෞතික විද්‍යා විෂය ධාරාව

CONFIDENTIAL

- සංයුක්ත ගණිතය - Combined Maths
- රසායන විද්‍යාව -Chemistry
- භෞතික විද්‍යාව - Physics

භෞතින විද්‍යා විෂය ධාරාව- Physical Science

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂි විද්‍යාව
- ජීව විද්‍යාව

තුන්වන විෂය

- විදුලි/යාන්ත්‍රික, ඉලෙක්ට්‍රොනික
- පරිගණක ඉංජිනේරු
- භෞතික විද්‍යාව
- පරිගණක විද්‍යා
- ද්‍රව්‍ය හා සැපයුම් කළමනාකරණය
- ආගනනය හා තොරතුරු පද්ධති
- කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය
- කර්මාන්ත හා සංකර්ය පර්යේෂණ
- ආගනනය හා තොරතුරු පද්ධති
- බුද්ධිමය යන්ත්‍ර විද්‍යාව

ජෛව විද්‍යා අංශයේ උපාධි පාඨමාලා

## 3.5
### තාක්ෂණවේදය විෂය ධාරාව

**ඉංජිනේරු තාක්ෂණවේදය**

- ඉංජිනේරු තාක්ෂණවේද
- තාක්ෂණය සඳහාවිද්‍යාව

**ජෛව තාක්ෂණවේදය**

- ජෛව තාක්ෂණවේදය
- තාක්ෂණය සඳහා විද්‍යාව

**තෙවන කාණ්ඩ විෂයය**

- ආර්ථික විද්‍යාව,
- භූගෝල විද්‍යාව,
- ගෘහ ආර්ථික විද්‍යාව,
- ඉංග්‍රිසි,
- සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය,
- චිත්‍ර කලාව,
- ව්‍යාපාර අධ්‍යයනය,කෘෂි විද්‍යාව,
- ගිණුම්කරණය
- ගණිතය

තාක්ෂණවේදය උපාධිය

B – TEC NVQ iv - v - vi

CONFIDENTIAL

## 3.6

## විවිධ විෂය ධාරාව විවිධ විෂය ධාරාව(පොදු) හැදෑරීම මත තෝරා ගත හැකි උපාධි පාඨමාලාවන්

- තොරතුරුතාක්ෂණය (**Information Technology)**
- කළමණාකරණය හා තොරතුරු තාක්ෂණය (**MIT**)
- ප්‍රමාණ සමීක්ෂණ ( **Quantity Surveying-QS** )
- මැහුම් විද්‍යාව ( **Surveying Science** )
- නගර හා ග්‍රාම නිර්මාණ ( **Town and Country Planing** )
- වාස්තු විද්‍යාව (**Architecture** )
- විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය (**Fashion Design & Product Development)**
- විලාසිතා නිර්මාණකරණය**(Fashion Design)**
- රෙදිපිළි නිර්මාණකරණය**(Textile Design)**
- භූමි නිර්මාණවේදය (**Landscape Architecture** )
- නිර්මාණවේදය **(Design)**
- නීතිය ( **Low**)
- පහසුකම් කළමනාකරණය (**Facilities Management**)
- පරිගණකය සහ කළමණාකරණය (**Computation & Management** )
- කළමණාකරණය සහ තොරතුරු තාක්ෂණය ( **Management and Information Technology**)
- විද්‍යාව හා තාක්ෂණය (**Science & Technology** )
- පරිගණක විද්‍යාව හා තාක්ෂණය ( **Computer Science & Technology**)
- ව්‍යවසායකත්වය සහ කළමණාකරණය**(Entrepreneurship and Management)**
- තේ තාක්ෂණ අගය වැඩි කිරීම (**Tea technology and Value addition)** )
- කාර්මික තොරතුරු තාක්ෂණය (**Industrial Information Technology)** )

CONFIDENTIAL

- තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම**(Palm and Latex Technology and Value Addition)**
- සිද්ධි කළමනාකරණය- **Events Management**)
- ශාරීරික අධ්‍යාපනය (**Physical Education** )
- ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරණය (**Sports Science and Management** )
- කථන හා ශ්‍රවණ විද්‍යා (**Speech & Hearing Science** )
- තොරතුරු තාක්ෂණය හා කළමණාකරණය (**Information Technology & Management** )
- තොරතුරු පද්ධති (**Information System** )
- පරිවර්තන අධ්‍යයනය (**Translation Studies** )
- සිනමා හා රූපවාහිනී අධ්‍යයයනය (**Film & Television Studies** )
- ව්‍යාපෘති කළමණාකරණය ( **Project Management**)
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව ( **Software Engineering**)
- ආහාර ව්‍යාපාර කළමණාකරණය (**Food Business Management** )
- සාගර හා මිරිදිය විද්‍යාව ( **Marine and Fresh water Science**)
- ව්‍යාපාර විද්‍යාව ( **Business Science**)
- මූල්‍ය ඉංජිනේරුකරණය (**Financial Engineering** )
- භූගෝලීය ඉංජිනේරු විද්‍යාව (**Geographical Information Science** )
- මූල්‍ය ගණිතය සහ කාර්මික සංවරණය ( **Financial Mathematics and Industrial**

CONFIDENTIAL

## 3.7


### 13+ -- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපනය

| Cluster | Subjects |
|---|---|
| සෞඛ්‍යය හා සමාජ සේවා<br>**Health and Social Care** | **1.** ළමා මනෝ විද්‍යාව සහ ආරක්ෂාව - **Child psychology and care** |
| | **2.** සෞඛ්‍යය හා සමාජ ආරක්ෂාව- **Health and Social Care** |
| | **3.** ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා- **Physical Education & Sports** |
| සමාජ හා සංස්කෘතික අධ්‍යයන<br>**Socio- cultural studies** | **4.** ප්‍රසාංගික කලා- **Performing Arts** |
| | **5.** සිද්ධි අධ්‍යයනය- **Event Management** |
| | **6.** චිත්‍ර හා මූර්ති-**Art &craft** |
| නිර්මාණවේදය<br>**Designing** | **7.** අභ්‍යන්තර නිර්මාණකරනය -**Interior Designing** |
| | **8.** මෝස්තර නිර්මාණය- **Fashion Design** |
| | **9.** ග්‍රැපික් නිර්මාණකරණය-**Graphic Design** |
| | **10.** චිත්‍ර හා නිර්මාණකරණය-**Art and Designing** |
| | **11.** වෙබ් නිර්මාණයකරණය-**Web Designing** |
| | **12.** භූමි දර්ශන සැකසුම්- **Landscaping** |
| කෘෂි හා ආහාර තාක්ෂණය<br>**Argo & food Technology** | **13.** ව්‍යවහාරික උද්‍යාන විද්‍යාව- **Applied Horticultural** |
| | **14.** පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයන- **Livestock Product Studies** |
| තාක්ෂණික අධ්‍යයන<br>**Technical Studies** | **15.** ආහාර සැකසුම් අධ්‍යයනය- **Food processing Studies** |
| | **16.** ජලජ සම්පත් අධ්‍යයන-**Aquatic Resource Studies** |
| | **17.** වැවිලි නිෂ්පාදන අධ්‍යයන -**Plantation Product Studies** |
| | **18.** ඉදිකිරීම් අධ්‍යයන-**Construction Studies** |
| | **19.** ඔටෝ මොබයිල් අධ්‍යයන- **Auto mobile Studies** |
| | **20.** විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයන**Electrical and Electronic Studies** |
| | **21.** රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයන- **Textile and Apparel Studies** |
| | **22.** ලෝහ පිරිසැකසුම් අධ්‍යයන- **Metal Fabrication Studies** |
| | **23.** ඇලුමිනියම් පිරිසැකසුම් අධ්‍යයන-**Aluminum Fabrication Studies** |
| | **24.** මෘදුකාංග සංවර්ධනය- **Software Development** |
| **Tourism and Hospitality** | **25.** සංචාරක හා ආගන්තුක සත්කාර- **Tourism and Hospitality** |
| **Environment and related studies** | **26.** පාරිසරික අධ්‍යයන-**Environmental Studies** |

CONFIDENTIAL

සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානම් වීම
පාඩම් කිරීමේ හා මතක තබා ගැනීමේ ක්‍රමවේද





## සාමාන්‍යපෙළ විභාගයෙන් විශිෂ්ට ජයග්‍රහන ලබාගැනිමට නම්...

<u>සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ට සාමාර්ථ ලබා ගැනීමට ගත යුතු පියවර.</u>

උසස්පෙල හැදැරීමට මහත් අපේක්ෂා පෙරදැරිව සාමාන්‍ය පෙලට මුහුණ දෙන ඔබ , එය සාර්ථක කරගැනීමට මේ කාලය තුළ  කටයුතු කල යුත්තේ කෙසේද?

- ඒනිසා සාමාන්‍යපෙළ විභාගය සමත්වීම මේ වසරේ ඔබගේ ඉලක්කයකි. ඉලක්කයක් සෑම විටම අභියෝගයක් විය යුතුය. ඉලක්කයක් යනු දින නියමයක් ඇති සිහිනයකි.
- ඒසේ නම් අපේක්ෂා පෙරදැරිව සාමාන්‍ය පෙළින් සාර්ථක වීම සඳහා කටයුතු කලයුත්තේ කෙසේදැයි දැයි සලකා බැලීම යුතුවේ.

- ක්‍රමානුකූලව පාඩම් කිරීම කිරීම මගින් ඔබගේ ජයග්‍රහණය තහවුරු කරගන්නේ කෙසේද.

පළමුව ඔබ ගැනි විමසා බලන්න

- පාඩම් කිරීමේදී ඔබ සතුව ඇති ශක්තීන්, දුර්වලතා මොනවාද? හඳුනා ගන්න. එසේම ඔබට ඇති අවස්ථාවන් සේම ඔබේ ගමනට තර්ජනකාරී දේවල් මොනවාදැයි හඳුනා ගන්න. එමගින් ඔබේ අනාගත අරමුණට යන ගමන් මාර්ගයේ ඔබට හමුවන බාධක මෙන්ම අභියෝගකාරී දේවල් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිවනු ඇත.

### පාඩම් කිරීමේ දී ඔබට ඇති බාධාක හෝ ඔබ සතු දුර්වලතා මොනවාද?

විවිධ ඇබ්බැහිවීම්- රූපවාහිනිය, වීඩියෝ ක්‍රීඩා, අනවශ්‍ය ලෙස සමාජ මාධ්‍ය භාවිතය,

මත් ද්‍රව්‍ය මත්පැන් අනවශ්‍ය සබඳතා ,අමතකවීම

### දුර්වලතා අවම කරන්නේ කෙසේද?

1. වැදගත් හා වහා කල යුතු කටයුතු හඳුනා ගැනීම හා අත්‍යාවශ්‍යය කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබාදීම
2. නැහැ / බැහැ කියන්න ඉගෙන ගන්න.
    - වැරදි චාර්යාවලට, අනුමත නොකරන සබඳතාවලට කිසිවකු කථා කළහොත් නැහැ, බැහැ කියන්න. එඩිතර වන්න.
    - වැරදි දෙයින්, කාලය අපතේ යන ක්‍රියාවලින් ඈත් වන්න. ඊට ආත්ම ශක්තිය වර්ධනය කර ගන්න.
    - ගැටළුවක්, විචිකිච්ඡාවක්, සැකයක් මතු වු කල්හි උපදේශකවරයෙකුගේ, දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ අදහස් විමසා කටයුතු කරන්න.

CONFIDENTIAL

## අමතක නොවන ලෙස පාඩම් කිරීම

ඕනෑම විභාගයක් සාර්ථකව ජය ගැනීමට අවධානය යොමු කල යුතු ප්‍රධාන කරුණු දෙකකි.

1 මතක සිටින සේ පාඩම් කරන්නේ කෙසේද...

11 කාලය මනා ලෙස හසුරුවාගන්නේ කෙසේද...

## ඇයි අපට අමතක වන්නේ

**"අමතක වීමේ වක්‍රය " .**

අද ඉගෙනගත් දේ .... අද සිට පැය 24 ක් යන විට 50%

දවස් 2 ක් ගිය තැන .. 40% ක්, දවස් 4ක් ගිය විට 20%

ලෙස අද ඉගෙන ගත් දෙයක් දින පහක් පමණ යනවිට මතකයෙන් අමතක වී යාම සෑම මනුෂ්‍යයෙකුටම පොදු දෙයකි.




## මතක හිටින ලෙස පාඩම් කරන්නේ කෙසේද

ආවර්ජනය

- **පලවන මතක ආවර්ජනය**
  යම් කොටසක් පාඩම් කල වහාම පොත වසා සිතින් ඒ සියල්ල ආවර්ජනය කිරීමයි.
- **දෙවන මතක ආවර්ජනය**
  පාඩම් කර විනාඩි 15 – 20 කාලයක් ගියාට පසු ආවර්ජනය කිරීම
- **තුන්වන මතක ආවර්ජනය**
  පාඩම් කර පැය 8 -9 කට පසු ආවර්ජනය කිරීම උදා - උදේ පාඩම් කල දේ හවස ආවර්ජනය කිරීම
- **හතරවන මතක ආවර්ජනය**
  අද පාඩම් කල දේ පහුවදා ආවර්ජනය කරීම

මෙම ක්‍රමය මගින් ඕනෑම අමාරු දෙයක් මතක තබා ගත හැකි බව මනෝවිද්‍යඥයින් අත්හදා බැලූ ක්‍රමවේදයක

## පාඩම් මතක තබා ගැනීමේ ශිල්ප ක්‍රම.

පාඩම් කිරීමේදී නිවැරදි ක්‍රම ශිල්ප භාවිතා කරන්න.

✶ පාඩම් කරන ක්‍රම ශිල්ප

CONFIDENTIAL

- ✶ පාසල් පංති කාමර හා පුද්ගලික පංති වලදී ඉගෙනීමේ නිවැරදි ක්‍රම
- ✶ නිවැරදිව සටහන් ලිවීම - කෙටි සටහන්, චිත්ත සිතුවම් සෑදීම ගැන උනන්දුවන්න.

**කාලය නිවැරදිව කළමනාකරණය කර ගන්න.**

- ✶ දෛනික කාල සටහනක් සකසා ඊට අනුගත වන්න.
- ✶ ආහාර - පෝෂණය, ව්‍යායාම - ක්‍රීඩා ( විනාඩි 30 - 60 ) ,විවේකය, විනෝදය සඳහා කාලය වෙන් කරන්න.
- ✶ නින්ද - රාත්‍රී නින්ද අනිවාර්යයෙන්ම පැය 06 - 07 ක් පමණ ගන්න
  - ✶ රූපවාහිනිය /ජංගම දුරකතන/ අත්‍යවශ්‍ය හේතූන් වලට මිස ඒවා පාලනයකින් යුක්තව භාවිතා කිරීම.
- ✶

පාඩම් කිරීමට සුදුසු ක්‍රම භාවිතා කරන්න.




- ✶ ඔබගේ ඉගෙනුම් ශෛලිය හඳුනා ගන්න.

  දෘෂ්‍ය ශ්‍රව්‍ය හසුරු කුසලතා
- ✶ සන්වේදන ඉන්ද්‍රිය වැඩි ගණනකින් පාඩම් කරන්න.
- ✶ පාඩම් කිරීමේ ක්‍රමශිල්ප අනුගමනය කිරීම.

  MIND MAP ගොඩනැගීම -

  කෙටි සටහන්

  .SQ3R ක්‍රමය









<u>පිළිතුරු ලියා පුරුදු වන්න</u>**.**

- ✶ පසුගිය වසරවල ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- ✶ ලියූ පිළිතුරු වලට කෙටි සැකිල්ලක් සාදා අමුණා ගන්න.

CONFIDENTIAL

- ✶ ඔබ ලියූ පිළිතුරු ගුරුවරුන්ට දී පරීක්‍ෂා කරවා ගෙන උපදෙස් ලබා ගන්න.




## 5.
## සාමාන්‍ය පෙළපෙළ විභාගයෙන් පසු ජීවිතය

### 5.1 අධ්‍යාපන

5.2 වෘත්තීමය පාඨමාලා හැදෑරීම.

5.3 වෘත්තීය අධ්‍යාපනය- රැකියා සඳහා අවශ්‍ය පුහුණුව ලබා ගැනීම.

5.4 සෘජුවම රැකියාවලට ඇතුල්වීම.

5.5 ස්වයං රැකියාවක් ඇරඹීම.

CONFIDENTIAL



අ.පො.ස. න් පසු........

විශ්ව විද්‍යාලයකට ඇතුළත් වී උපාධි පාඨමාලාවක් ඇරඹීම.

- දේශීය විශ්ව විද්‍යාල
- රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල හෝ ආයතනවල අනුබද්ධිත විශ්ව විද්‍යාල. ( විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය සහිත )
- විදේශීය විශ්ව විද්‍යාලයන්ට අනුබද්ධිත දේශීය විශ්ව විද්‍යාල කැම්පස්
- විදේශ විශ්ව විද්‍යාල

- පාසල් අධ්‍යාපනයෙන් පසු ඔබ උසස් පෙළ විභාගය ඉහළින් සමත් ව ඇති නම් ඔබට දේශීය විශ්ව විද්‍යාලයකට ඇතුළත්ව උපාධියක් ලබා ගත හැකිය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විශ්ව විද්‍යාල 15කි. තමන් උසස් පෙළ විභාගයට තෝරාගෙන ඇති විෂයයන් අනුව විශ්ව විද්‍යාලයේ හැදෑරිය හැකි පාඨමාලා තීරණය වේ.

CONFIDENTIAL

- විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ගැනිමට අපොහොසත් වුවහොත් ඔබට ඇතැම් විශ්ව විද්‍යාල මඟින් පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලා සඳහා ද ලියාපදිංචි වී අධ්‍යාපනය ලබාගත හැකිය.

- ඉහත සඳහන් උපාධි අවස්ථා මෙන්ම උසස් ඩිප්ලෝමා,ඩිප්ලෝමා, සහතිකපත්‍ර පාඨමාලා ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති,දර්ශනපති ආදී ( MSC / PHD ) උපාධි සඳහා ද උසස් අධ්‍යාපනයට දොරටු හැරේ.

- පහත සඳහන් වෙබ් අඩවිවලින් ඔබට අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.
  www.ugc.ac.lk
  www.moh.gov.lk

- ඒසේම රජය හා අනුබද්ධිත පෞද්ගලික, විදේශීය විශ්ව විද්‍යාල හා උපාධි ප්‍රදානය කරන ආයතන මඟින් ද ඔබට වැඩිදුර අධ්‍යාපනය ලබා ගත හැකිය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත්, පිළිගත් රජයේ මෙන්ම පෞද්ගලික විශ්ව විද්‍යාල ද විශාල ප්‍රමාණයක් ඇත. උපාධි ප්‍රදානය කරන ආයතන පිළිබඳ පෞද්ගලිකවම සොයා බලා සෑහීමකට පත්ව එම ආයතන මඟින් අධ්‍යාපනය හැදෑරීමේ හැකියාව ඇත.

CONFIDENTIAL

## 5.2

## වෘත්තීමය සම්ගම් මඟින් පවත්වාගෙන යනු ලබන වෘත්තීමය පාඨමාලා

**විදේශීය වෘත්තීය පාඨමාලා**

මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ වෘත්තීය සම්ගම් විසින් වන අතර පාඨමාලා හැදෑරීමෙන් පසුව වෘත්තිමය සුදුසුකම් ඇති වෘත්තිකයෙකු තත්ත්වයට පත්විය හැකි අතර ඒමඟින් ජාත්‍යන්තරයට ගැලපෙන වෘත්තිකයෙකු වීමේ අවකාශය ලබා ගත හැකිය. අ.පො.ස (සා. පෙ.) විභාගය සමත් නම් මෙහි සඳහන් බෙහෝ පාඨමාලා හැදෑරීමේ හැකියාව ලබාගත හැකිය.

### වෘත්තීය විභාග පවත්වනු ලබන වෘත්තීය සංගම්

| ක්ෂේත්‍රය | පාඨමාලාව | ආයතනය | වෙබ් |
|---|---|---|---|
| ගිනුම් ක්ෂේත්‍රය | ගණකාධිකරණ ශිල්පිය පාඨමාලාව(AAT) | ගණකාධිකාරී ශිල්පීය ආයතනය- Association of Accounting Technician of Sri Lanka | aatsl.lk |
| | වරලත් ගණකාධිකරණ පාඨමාලාව(CA) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය Institute of Chartered Accounts of Sri Lanka (ICA) | casrilanka.com |
| | වරලත් කළමනාකරණ ගණකාධිකරණය පිළිබඳ පාඨමාලාව- (CIMA-UK) | වරලත් කළමනාකරණ ගණකාධිකරණය පිළිබඳ ආයතනය Chartered Institute of Management Accountants (CIMA) | www.cimaglobal.com |
| | වරලත් සහතිකලත් ගණකාධිකාරණ පාඨමාලාව (ACCA) 0754845629 | වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය Association of Chartered Certified Accounts Sri Lanka | www.acca.lk |
| බැංකු ක්ෂේත්‍රය | බැංකුකරණය පිලිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ සංගමය Association of Professional Bankers, Sri Lanka (APB) . | info@ibsl.lk |
| අලෙවිකරණ ක්ෂේත්‍රය | අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (SLIM) | ශ්‍රී ලංකා අලෙවිකරුවන්ගේ ආයතනය Sri Lanka Institute of Marketing (SLIM) | www.slim.lk |
| | අලෙවිකරණය පිළිබඳ වරලත් පාඨමාලාව (CIM) | ඒක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනය Chartered Institute of Marketing | www.cim.co.uk |
| මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තිමය පාඨමාලාව(IPM-SL) | Chartered Institute of Personnel Management | www.ipmlk.org |
| නීති ක්ෂේත්‍රය | නීති උපාධිය නීතිය පිළිබඳ වෘත්තිමය පාඨමාලාව | කොළඹ/යාපනය/පේරාදෙනිය/විවෘත විශ්ව විද්‍යාල ශ්‍රී ලංකා නීති විද්‍යාලය-Sri Lanka Law College | www.sllc.ac.lk |


CONFIDENTIAL

| | | | |
|---|---|---|---|
| රසායන විද්‍යා | රසායන විද්‍යාව පිළිබඳ වෘත්තීමය පාඨමාලාව | ශ්‍රී ලංකා රසායන විද්‍යාඥයින්ගේ ආයතනය Institute of Chemistry, Ceylon (ICC) | ichemc@sltnet.lk |
| ඉංජිනේරු <u>ක්ෂේත්‍රය</u> | ඉංජිනේරු පිළිබඳ වෘත්තීමය විභාගය | ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය Institute of Engineering Sri Lanka | wwwiesl.lk/collegeofengineering |
| වාස්තු විද්‍යා | වාස්තු විද්‍යාව පිළිබඳ වෘත්තීයමය පාඨමාලාව | ශ්‍රී ලංකා වාස්තු විද්‍යඥයින්ගේ ආයතනය Sri Lanka Institute of Architects (SLIA) | slia.lk |
| පිරිස් කළමනාකරණය | පිරිස් කළමනාකරණය පිළිබඳ වෘත්තීමය පාඨමාලාව (CIPM) | වරලත් පිරිස් කලමනාකරණ ආයතනය Chartered Institute of Personnel Management(CIPM) | www.cipmlk.org |
| ප්‍රමාණ සමීක්ෂණ | ප්‍රමාණ සමීත්ෂණය පිළිබඳ වෘත්තීමය පාඨමාලාව | ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය Institute of Quantity Surveyors Sri Lanka (IQSL) | www.iqssl.lk |
| ලේකම්කරණය | ලේකම්කරණය පිළිබඳ වෘත්තීමය පාඨමාලාව (ICSASL) | Institute of Chartered Secretaries and Administrators in Sri Lanka (ICSASL) | www.iccslk.org |
| ගබඩා පාලනය | ගබඩාකරණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා ද්‍රව්‍ය කලමනාකරණ ආයතනය Institute of Supply and Materials Management (ISMM) | ismmsrilanka.com |
| නාවික ක්ෂේත්‍රය | නාවිකකරණය පිළිබඳ වරලත් පාඨමාලාව | වරලත් නැව්කරුවන්ගේ ආයතනය Institute of Chartered Shipbrokers, Sri Lanka Branch (ICS) | |
| | | | |

වැඩි විස්තර

www.opasrilanka.org

CONFIDENTIAL




CONFIDENTIAL

## 6.3 වෘත්තීය පුහුණු පාඨමාලා

වෘත්තීය පුහුණුව ඉතා වැදගත් ක්ෂේත්‍රයකි. අප රට සංවර්ධනය කරා යාමේදී ශාස්ත්‍රීය අධ්‍යාපනය හා සමගාමීව වෘත්තීය පුහුණුව ලත් විශේෂඥයන් අවශ්‍ය වේ. ඒබැවින් වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය, පෞද්ගලික ආයතනවලට සම්බන්ධ වී වෘත්තීය පාඨමාලා හැදැරිය හැක.

වෘත්තිය සුදුසුකම් රාමුවට ඇතුලත් වීම මගින් ලබාගත හැකි ප්‍රතිලාභ

- ජාත්‍යන්තර ප්‍රමිතියට ගැලපෙන නිපුණ ශ්‍රමිකයෙකු වීමේ අවකාශය ලබා ගත හැකිය.
- දේශීය, විදේශීය රැකියා අවස්ථා , ව්‍යවසායෙකු වීමේ අවස්ථාව
- උසස් පෙළින් පසු වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සඳහා යොමු වන්නේ නම් වෘත්තීය සුදුසුකම් රාමුවේ ඉහළට යාමේ හැකියාව.
- විශ්ව විද්‍යාල විද්‍යා ආයතන මඟින් NVQ 5/6 මට්ටම් ලබාගත හැකිවීම
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මඟින් NVQ 7 ලබා ගත හැකිවීම.

**පාසල් අධ්‍යාපනයට ඒකතු වී ඇති වෘත්තීය අධ්‍යාපනය ක්ෂේත්‍ර**


- තාක්ෂණික විෂය ධාරාව හා
- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපනය

**ජාතික සුදුසුකම් රාමුව යටතේ NVQ 3/5 ලබාදෙන ආයතන**

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ජාතික ආධුනිකත්ව හා කර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ඉංජිණේරු තාක්ෂණ ආයතනය
- කර්මාන්ත ඉංජිණේරු අභ්‍යාස ආයතනය
- මෝටර් රථ ඉංජිණේරු අභ්‍යාස ආයතනය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- ජාතික තරුණ සේවා සභාව
- ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අභ්‍යාස ආයතනය
- ඩොක් යාර්ඩ් ආයතනය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

CONFIDENTIAL

වෘත්තීය සංවර්ධන මාවත- වෘත්තීය පුහුණු හා තාක්ෂණික



## 7' සෘජුවම රැකියා වෙළඳපොළට පිවිසීම

සාමාන්‍ය පෙළ , උසස් පෙළ විභාගය සමත් වූ පසු විවිධ ආයතන වලට ඉල්ලුම් කර රැකියා ලබා ගත හැකිය. තම තමන් ලබා ඇති විභාග සාමාර්ථයන්, විෂය සමගාමී කටයුතු, ක්‍රීඩා කුසලතා, නායකත්ව කුසලතා, සෞන්දර්ය කුසලතා ආදිය සැලකිල්ලට ගෙන සෘජුවම රැකියාවලට බඳවා ගැනීම් සිදු කෙරේ. රැකියාවක් ලබා ගැනීමට උනන්දු වන ඔබ ඒ පිළිබඳව දැනුවත් විය යුතුය අතර ඒ සඳහා අවශ්‍ය පෙර සූදානමක් පාසල් කාලයේ සිටම තිබිය යුතුය.

### රැකියා ලෝකය හා ඒහි නව ප්‍රවනතා

- වර්තමානයේ රැකියා ලෝකය තොරතුරු හා නවීන සන්නිවේදන තාක්ෂණය හරහා අප නොසිතූ විරූ වේගයෙන් වෙනස් වේ. ඒහෙයින් ඔබ පාසලින් වැඩ ලොවට පැමිණිය යුත්තේ වෙනස්වන ලෝක ප්‍රවනතාවයන් සැලකිල්ලට ගෙන ඊට ගැලපෙන ලෙස සකස් විය හැකි පුද්ගලයෙකු ලෙසයි.

  වෙනස කොතරම් වේගවත් ද යත් ඒය පුරෝකතනය කිරීම පවා දුෂ්කරය. ඒහෙත් ඒ වෙනස කුමක් වුවත් ඒ වෙනසට Hard skill ඒනම් අධ්‍යාපන සුදුසුකම් විවිධ පුහුණු පාඨමාලා මඟින් ලබාගත් සුදුසුකම් සේම මෘදු කුසලතාවන් ද අවශ්‍ය වේ.

.

- මේ තුළින් වෙනස්වීම තුළ නොනැසී ඔබට ඔබේ පැවැත්ම තහවුරු කර ගත හැකි වනු ඇත. ඒනිසා ඔබ කරුණු පාඩම් කරනවාට වඩා මෙම කුසලතා දියුණු කර ගනිමින්, අධ්‍යාපනය තුළින් සාර්ථක වීමට අවධානය යොමු කළ යුතු වේ.
- මෘදු කුසලතා

  ජීවත් වීමේදී සේම අනාගත වැඩ ලෝකය තුළදී Hard skill සේම මෘදු කුසලතාවන් ඒසේ නැතිනම් රැකියා යෝග්‍ය කුසලතා (Employability Skills)ද අවශ්‍ය වේ.

  වෘත්තීය පලපුරුද්ද
  ප්‍රායෝගික පලපුරුද්ද
  තොරතුරු තාක්ෂණ හැකියාව
  නිර්මාණශීලීත්වය,
  නම්‍යශීලීත්වය ,
  නවෝත්පාදන හැකියාව,
  විවේචනාත්මක චින්තනය,
  නවෝත්පාදන හැකියාව
  අනුගතවීමේ හැකියාව,
  සහයෝගීතාවය,
  සන්නිවේදනය
  නායකත්වය
  අවධානම් කළමනාකරණය
  ගැටළු විසඳීම
  ස්වයං කලමනාකරණය යන කුසලතාවන්ය.

CONFIDENTIAL

8 ව්‍යවසායයෙකු වීම.

ව්‍යවසායකත්වය යනු මුළු ලෝකයේම නිමා නොවන නව රැල්ලයි.  නව ලොවට අවශ්‍ය වන්නේ රැකියා සොයන්නන් නොව රැකියා තනන්නන්ය. ඒනිසා ඔබ සිටින තත්ත්වය කුමක් වුවත් නව අදහසක් ඔබ සතු නම් ඔබට ඔබගේම ව්‍යවසාය ව්‍යාපාරයක් ආරම්භ කළ හැකියි.
ඒසේම  ඔබගේ හැකියාව, දක්ෂතාවය, කැමැත්ත ඇති ක්ෂේත්‍රයකින් අධ්‍යාපනය ලබා හෝ යම් ක්ෂේත්‍රයකට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාගැනීමෙන්  අනතුරුව ඔබට ඔබගේම ව්‍යවසායක් ආරම්භ කිරිමේ හැකියාව පවතී. ඒසේම මේ පිළිබඳව ඔබට අධ්‍යාපනය ලබමින් ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ ඉදිරියට යාමට අවශ්‍ය නම් ඒ සඳහාත් අවස්ථාව පවතී.

ඒ අනුව ව්‍යාවසායකත්වය උදෙසා සහාය සේවාවන් ලබාදෙන ආයතන ප්‍රධාන වශයෙන් කොටස් තුනක් යටතේ දැක්විය හැකිය.

- ව්‍යවසායකත්වය පිළිබඳ අධ්‍යයන හා පුහුණු ලබාදෙන ආයතන
  - ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ- ent@sjp.ac.lk
  - **ඔබේ ව්‍යාපාරය ආරම්භ කරන්න වර්ධනය කර ගන්න  ආයතනය (SIYB)** ceo@siybsrilanka.org
- මූල්‍ය සහාය සේවාවන් ලබාදෙන ආයතන-බැංකු හා මූල්‍ය ආයතන
- තාක්ෂණික හා වෙනත්
  - කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය -sed.gov.lk
  - 
  - මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්මේන්තුව- dome.gov.lk
  - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය- http:www.neda.gov.lk
  - කාර්මික සංවර්ධන මණ්ඩලය-idb.gov.lk
  - සබා ශ්‍රී ලංකා ආයතනය www.sabahlk.org
  - කැතීරිච් මධ්‍යස්ථානය් catrih@sltnet.lk
  - කාර්මික තාක්ෂණ ආයතනය- info@iti.lk

CONFIDENTIAL

**අ.පො. ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසු ඔබට ප්‍රවේශ විය හැකි වෘත්තිය මාවත් පිළිබඳ දැන් ඔබට අවබෝධයක් ඇත.**


**අනාගතය පිළිබඳ සුභ සිහිනකයක් දැන් ඔබට ඇත.**

**ඔබගේ  සිහිනවල සිට අරමුණු ඔස්සේ සාර්ථකත්වය කරා යාමට නම්....**

**අනාගය පිළිබඳ නිවැරැදි දැක්මක්  සේම......**

**ඒ කරා යාමට ධෛර්යද.....   නොපසුබට උත්සාහයද....**

**ඔබ සතු විය යුතුයි.**



CONFIDENTIAL

CONFIDENTIAL